# දරිද්‍රතා දර්ශක

## ගෘහ ඒකක ආදායම් හා වියදම් තොරතුරු

## 2006/07

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- මුලික ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය සඳහා එක් පුද්ගලයකුට මාසිකව අවශ්‍ය අවම වියදම් ප්‍රමාණය යන්න දරිද්‍රතා රේඛාව ලෙස හැදින්වේ. 2002 වර්ෂයේදී දරිද්‍රතා රේඛාව රු 1,423 කි.

- 2006 ජුලි සිට 2007 ජුනි දක්වා ඇස්තමේන්තු දරිද්‍රතා රේඛාවේ අගය රු 2,233 කි. (එක් මාසයක් සඳහා එක් පුද්ගලයකුට අවශ්‍ය අවම වියදම )

- යම්කිසි පුද්ගලයකු දරිද්‍රතා රේඛාවේ අගයට අඩුවෙන් වියදම් කරයි නම් ඔහු දුප්පත් පුද්ගලයකු ලෙස හැදින්වේ.

- දුප්පත් ජනගහනයේ ප්‍රතිශතය (ජනගහන දරිද්‍රතා දර්ශකය) 2002 දී 22.7% ක්වු අතර 2006/07 සමීක්ෂණයේදී එය 15.2% දක්වා අඩුවී ඇත.

## දුප්පත් ජනගහනයේ ප්‍රතිශතය (ජනගහන දරිද්‍රතා දර්ශකය) - 2002 සහ 2006/07

| දිස්ත්‍රික්ක | ජනගහන දරිද්‍රතා දර්ශකය 2002 | ජනගහන දරිද්‍රතා දර්ශකය 2006/07 |
|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **22.7** | **15.2** |
| කොළඹ | 6.4 | 5.4 |
| ගම්පහ | 10.7 | 8.7 |
| කළුතර | 20.0 | 13.0 |
| මහනුවර | 24.9 | 17.0 |
| මාතලේ | 29.6 | 18.9 |
| නුවරඑලිය | 22.6 | 33.8 |
| ගාල්ල | 25.8 | 13.7 |
| මාතර | 27.5 | 14.7 |
| හම්බන්තොට | 32.2 | 12.7 |
| මඩකලපුව | NA | 10.7 |
| අම්පාර | NA | 10.9 |
| කුරුණෑගල | 25.4 | 15.4 |
| පුත්තලම | 31.3 | 13.1 |
| අනුරාධපුරය | 20.4 | 14.9 |
| පොලොන්නරුව | 23.7 | 12.7 |
| බදුල්ල | 37.3 | 23.7 |
| මොනරාගල | 37.1 | 33.2 |
| රත්නපුරය | 34.4 | 26.6 |
| කෑගල්ල | 32.5 | 21.0 |


ජනගහන දරිද්‍රතා දර්ශකය, 2002 වර්ෂයට වඩා බොහෝ දිස්ත්‍රික්කවල 2006/07 වර්ෂවල අඩුවී ඇත.

මෙයින් කැපිපෙනෙන ලෙස අඩු වී ඇත්තේ හම්බන්තොට හා පුත්තලම දිස්ත්‍රික්ක වලයි.

- මාතලේ, ගාල්ල, මාතර, බදුල්ල, පොලොන්නරුව හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වල සැලකිය යුතු මට්ටමකින් දරිද්‍රතාවය අඩු වී ඇත.

- ජනගහන දරිද්‍රතා දර්ශකයේ ඉහලම අගය වාර්තා වන්නේ නුවරඑලිය දිස්ත්‍රික්කයේ වන අතර එය 33.8% කි. අඩුම ජනගහන දරිද්‍රතා දර්ශකය කොළඹ දිස්ත්‍රිකයෙන් වාර්තාවන අතර එය 5.4% කි.

## ජනගහන දරිද්‍රතා දර්ශකය දිස්ත්‍රික්ක අනුව - 2006/07





- මූලාශය
- ජ.සං.දෙ. - ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය

# ආදායම - 2006/07


- ශ්‍රී ලංකාව සඳහා මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායම රු.16,735 ක් වේ. (මුළු ගෘහ ඒකක වලින් 50% ක් ගෘහ ඒකක රු.16,735 ට අඩු මාසික ආදායමක් ලබයි.)

- වැඩිම මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායම වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. එය මසකට රු. 24,711 වේ. අඩුම මධ්‍යස්ථ ආදායම වාර්තා වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි. එය මාසිකව රු. 11,914 වේ.

# දිස්ත්‍රික්ක වශයෙන් මධ්‍යස්ථ ආදායම





# සමස්ථ ගෘහ ඒකක ආදායම් බෙදීයාම




ශ්‍රී ලංකාවේ මුළු ගෘහ ඒකක ආදායමින් 55% ක් ඉහල ආදායම් ලබන ගෘහ ඒකක 20% ලබා ගන්නා අතර පහල අදයම් ලබන ගෘහ ඒකක 20% ලබා ගෙන ඇත්තේ මුළු ගෘහ ඒකක ආදායමින් 5% ක් වේ.

- ශ්‍රී ලංකාව සදහා ආහාර හා බීම වර්ග (අමද්‍යප) සදහා සම්පූර්ණ වියදමින් වැය වන ප්‍රතිශතය (ආහාර වියදම් අනුපාතිකය) 37.6% ක් බව 2006/07 සමීක්ෂණයෙන් දක්වේ.
- වැඩිම ආහාර වියදම් අනුපාතිකය (53.9%) නුවරඑලිය දිස්ත්‍රික්කයෙන් ද අඩුම ආහාර වියදම් අනුපාතිකය (29.2%) කොළඹ දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වේ.

## ආහාර වියදම් අනුපාතික අගය දිස්ත්‍රික්ක වශයෙන්




- ශ්‍රී ලංකාව සඳහා ගෘහ ඒකක සාමාන්‍ය මාසික වියදම රු. 22,952 කි. එයින් රු. 8,461 ක් ආහාර හා බීම වර්ග (අමද්‍යප) සඳහා වියදම් කරයි.

- වැඩිම ගෘහ ඒකක සාමාන්‍ය මාසික වියදම රු. 37,011 ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම ගෘහ ඒකක සාමාන්‍ය මාසික වියදම රු.13,155ක් මොනරාගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවේ.

සෞඛ්‍ය පුද්ගලික අවශ්‍යතා, ආලෝකය, නිවාස, ගමනාගමනය හා අධ්‍යාපනය සඳහා මධ්‍යනය ගෘහ ඒකක වියදම


| දිස්ත්‍රික්කය | සෞඛ්‍ය හා පුද්ගලික අවශ්‍යතා රු. | ඉන්ධන හා ආලෝකය රු. | නිවාස රු. | ගමනාගමනය රු. | අධ්‍යාපනය රු. |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | **980** | **1042** | **2639** | **1862** | **632** |
| කොළඹ | 1354 | 1875 | 6874 | 3875 | 1233 |
| ගම්පහ | 1356 | 1326 | 3270 | 2474 | 925 |
| නුවරඑළිය | 594 | 794 | 1335 | 495 | 352 |
| මොනරාගල | 578 | 523 | 1182 | 883 | 298 |
| රත්නපුර | 755 | 750 | 1725 | 1272 | 482 |

## නිවාස, ගමනාගමනය සහ අධ්‍යාපනය සඳහා දිස්ත්‍රික්ක කිහිපයක ගෘහ ඒකකයක වියදම




- ශ්‍රී ලංකාවේ අනෙකුත් දිස්ත්‍රික්ක හා සැසඳීමේදී මොනරාගල දිස්ත්‍රික්කයේ නිවාස සහ අධ්‍යාපනය සඳහා අඩු ගෘහ ඒකක වියදමක් පෙන්නුම් කරයි.
- නුවරඑළිය දිස්ත්‍රික්කය අනෙකුත් දිස්ත්‍රික්ක හා සැසඳීමේදී ගමනාගමනය සඳහා අඩු වියදමක් පෙන්නුම් කරයි.
- ශ්‍රී ලංකාවේ අනෙකුත් දිස්ත්‍රික්ක හා සැසඳීමේදී කොළඹ දිස්ත්‍රික්කය නිවාස, අධ්‍යාපනය ගමනාගමනය සඳහා වැඩි වියදමක් දරන බව පෙන්නුම් කරයි.

## සෞඛ්‍ය හා පුද්ගලික අවශ්‍යතා, ඉන්ධන හා ආලෝකය සඳහා දිස්ත්‍රික්ක කිහිපයක ගෘහ ඒකකයක වියදම




- ශ්‍රී ලංකාවේ අනෙකුත් දිස්ත්‍රික්ක හා සැසඳීමේදී මොනරාගල දිස්ත්‍රික්කය සෞඛ්‍ය හා පුද්ගලික අවශ්‍යතා, ඉන්ධන හා ආලෝකය සඳහා අඩු වියදමක් පෙන්නුම් කරයි.
- ශ්‍රී ලංකාවේ අනෙකුත් දිස්ත්‍රික්ක හා සැසඳීමේදී කොළඹ දිස්ත්‍රික්කය ඉන්ධන හා ආලෝකය සඳහා වැඩි වියදමක් පෙන්නුම් කරයි.
- අනෙකුත් දිස්ත්‍රික්ක හා සැසඳීමේදී ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කවල සෞඛ්‍ය සහ පුද්ගලික අවශ්‍යතා සඳහා ඉහල වියදමක් පෙන්නුම් කරයි.

ස්තූතියි !